# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2013 සැප්තැම්බර් 23 සඳුදා
05 වෙළුම - 46 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 52/ News/ 2013

මිල රු 10/-



Photo By: Thilina Alahakoon

## අභිමානවත් 25 වසරක් සමරණ
# ධර්මදූත ළමා සමාජය

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# භාවනාව, කතෝලික දරුවන්ටත් උරුම ආධ්‍යාත්මික ව්‍යායාමයක්

## ආදරණීය දුවේ පුතේ...

මෙවර ''ළමා ප්‍රදීපය'' පුවත් පතේ තුන් වන පිටුවේ ඥනෝපදේශ පිටුවෙහි තවත් අලුත් විශේෂාංගයක් හැටියට ගරු ශිරෝමා පැවිදි සොයුරියගේ ''භාවනාව හා ගැඹුරු දේව සබඳතාවය'' වන මැයෙන් ලිපියක් පළ වෙනවා. විශේෂ කොට පුංචි ඔබ වෙනුවෙන්ම මේ ලිපි පෙළ පළ කරනු ලබන්නේ කතෝලික අපේ යාච්ඤා සම්ප්‍රදාය තුළ භාවනාව අති විශිෂ්ට ව්‍යයාමයක් වන නිසාමයි. බොහෝ වේලාවට භාවනාව නැතිනම් යෝගි ව්‍යයාම් කතෝලික අපට උරුම නැතැයි යන දුර්මතයක් පවතිනවා. මෙය සම්පූර්ණයෙන්ම මුසාවක්.

ආදර දුවේ පුතේ, ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රසිද්ධ ජිවිතය ආරම්භ කළේත් පුරා දින 40 ක් තුළ භාවනාවේ යෙදීමෙන්. එකම දෙවියන් වහන්සේට වන්දනා කරන ආගමිකයින් අතර කතෝලිකයින් මෙන්ම මුස්ලිම්, ජුදෘ ජනතාවත් ගණන් ගත හැකියි. මේ සියලු දෙන හට භාවනාව, උපවාසය, හා ධ්‍යානගත වීම ඇත්තෙන්ම ආධ්‍යාත්මයෙන්ම උරුම ගුණාංගයක්.

ගරු ශිරෝමා පැවිදි සොයුරියගේ මේ ලිපි පෙළ ඔබ එකතු කර හොඳ අධ්‍යයනයක් කරන්න ඕනා. එතුමිය පවසන අයුරින්ම කතෝලික අපට මේ භාවනාව නිහඬ යාච්ඤාවට යොමු කරන විශේෂිතම ක්‍රම වේදයක්. පුංචි ඔබත් නිරතුරුවම යාච්ඤාවේ යෙදෙන විට පවසන දෙයක් නේද සිත එකලස් කර ගැනීම අපහසුයි කියා. ඉතිං යාච්ඤා කළ හැකි ක්‍රම වේදයන් අතර භාවනාව ප්‍රධාන වෙනකොට නිහඬ යාච්ඤාවට ප්‍රධානතම අත්වැල වන්නේ භාවනා ක්‍රම වේදයි. නිහඬ යාච්ඤාව දෙව් පියාණන් වහන්සේට ආදරය කරමින් පිදු ජේසු සමිඳුන් එයට ගත් අත් වැල නැතිනම් භාවනාව ගැන ශු. සුවිශේෂයම සාක්ෂ්‍ය ඇතිව කරුණු කාරනා පෙන්නුම් කර දෙනවා.

ශුද්ධවු ලුක් සුවිශේෂයේ හතර වන පරිච්ඡේදයේ පළමුවන වගන්තිය ගැන මඳක් විමසා බලන්න.

''ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව ජෝර්දනයෙන් ආපසු ආවිට ආත්මයාණන් වහන්සේ විසින් උන්වහන්සේ පාළුකරයට ගෙන යනු ලැබු සේක''.

මේ නිහඬ යාච්ඤාව පිළිගන්වන ජේසුස් ස්වාමින් වහන්සේ පුරා දින 40 ක් තුළ භාවනාව සැබෑ ලෙසම අත් දැක්කා. නිහඬතාවය එක්සත්බව හා හුදකලා බව තුළ භාවනාවේ සැබෑ ජීව ගුණය ජේසුස් ස්වාමින් වහන්සේ ගෙන හැර දක්වනවා.
බලන්න ශු. ලුක් සුවිශේෂයේ හයවන පරිච්ඡේදයේ 12 වන වගන්තිය. ''තවද ඒ දවස්වලදී උන්වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැඟී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවු සේක''.

මෙයත් ගැඹුරු භාවනාව තුළ උන්වහන්සේ ඉටු කළ ගැඹුරු ව්‍යායාමයක්. ස්වාමින් වහන්සේ යාච්ඤාව තුළ සමාධිගත වෙනවා. පාළුකරය තුළ ජේසු සමිදුණන් ශාරිරිකව හා මානසිකව සියලු බැඳීම් වලින් නිදහස් වෙලා ඇතුලාන්ත දැඩි නිශ්චල තාවයකට පත්කර ගන්නවා. ඇතුලාන්ත චින්ත සමාධිගත වීම බාහිරව ගැඹුරින් අත් දැක්ක ස්වාමින් වහන්සේ සාමාන්‍ය ජීවිත පැවැත්මෙන් කළ කිරීමට පත්ව ගියේ නැහැ. නිරන්තරයෙන්ම ගහ කොළ, සතා සිව්පාවට , සොබා දහමට , තිරිගු යායට , නදියට, ඇල, දොළ, ගංගා වලට ආදරය කරමින් ඒ වින්දනය තුළ ස්වාමින් වහන්සේ සිත් ශාන්තිය ඇති කර ගත්තා. සමාධිගත වුනා. පුද්ගලයින්ට, සොබා දහමට ආදරය කරන කොට ජිවිතයේ කිසිදු ඇතුලාන්ත භේදයකට ඉඩක් ඇති වන්නේ නැහැ.

ඒ භාවනාව තුළ පිදෙන යාච්ඤාව ඉතා බලවත්, ඒ නිසාම නේද කතෝලිකයා ජාතිභේද, ආගම් භේද ගැන පටු බවට පත් වෙලා සිතන්නෙ නැත්තේ. ඒ අනුව යාච්ඤාව හා භාවනාව ගැඹුරින්ම අත්දකින ආගමික ජනතාව අන් කවුරුත් නොව කතෝලිකයින්ම බව ඔබට වැටහෙනවා නේද?. කතෝලිකයා සමාධිගත වන විට තමා තුළ වැඩ වසන දෙව් පියාණන් හා සම්බන්ධ වෙනවා. දෙවිඳුන් හා ධ්‍යානගත වෙනවා. කතෝලික සම්ප්‍රදාය තුළ භාවනාව දැඩිව අත් විඳි අය තමයි අද නම් වන්නේ ශුද්ධවන්තයන් හැටියට. ගැඹුරු ධ්‍යානගතවීම තුළ සුවය අත් දකින අය යාච්ඤාවේ ගැඹුරු දේව විශ්වාසයට සාක්ෂි දරනවා.

ඉතිං ආදර දුවේ, පුතේ, භාවනාව කතෝලික අපට අයිති දෙයක්. අනාදිමත් කාලයක සිට කතෝලික සම්ප්‍රදායේ පවතින අධ්‍යාත්මික ව්‍යායාමයක්. මෙය වෙනත් ආගම් වල අයට පමණක් අයත් අභ්‍යාසයක් නොවේ.එම නිසා කතෝලික දූ දරුවන්වන ඔබ මේ භාවනා විධි ක්‍රම ගැන කුඩා කල සිටම දැනුම්වත් වෙන්න ඕනා. දැන් ඒ සඳහා පවත්වන නිවාඩු කඳවුරු සඳහා සම්බන්ධ වෙන්න ඕනා. ඒ සඳහා වෙන්වුන වෙනම පැවිදි පංතියකුත් දැන් අපේ රටේ තිබෙනවා. මේ මතක් කිරිම ඒ වෙනුවෙන්මයි.

**ඔබට ජේසු පිහිටයි**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා



## ඥානෝපදේශය

## ඒදිනෙදා ජීවිතයට යාච්ඤා

### කැඳවීම තෝරාගැනීම සඳහා යාච්ඤාව

දෙවි සමිඳුනි, ඔබ වෙනුවෙන් අප දිවි කැපකිරීම සඳහා අපගේ කැඳවීම කුමක්දැයි තෝරා බේරා ගැනීමට තරුණ අප සිතද, කයද ආලෝකමත් කළ මැනව. ආත්මාර්ථකාමී ලොවක ජීවත් වන අප මුලාවට පත් කරමින් වහල් සිතුවිලි තුළ සිරකරන, පහවී යන ප්‍රීතින් ප්‍රතික්ෂේප කිරීමට අප දිරිමත් කළ මැනව. ඔබ වෙනුවෙන් අප මුළු දිවියම වැය කරන්නටද, සියලුම මිනිසුන්ට ඔබ ප්‍රේමකරන බව නොබියව ප්‍රකාශ කරන්නටද, ඒ ප්‍රේමය අප තුළ සනාථ කරමින් දිවි ගෙවන්නටද අප දිරිමත් කළ මැනව. අපේ කාලයද, ශක්තියද පමණක් නොව අප මුළු දිවියද ඔබ දෙසු සාධාරණත්වය සහ සත්‍යය අගයන දේව රාජ්‍යය ගොඩ නැංවීම සඳහා කැප කරන්නටද අප මෙහෙය වුව මැනව.

සමිඳුනි, අපට පිහිට වුව මැනව. සදාකාලයෙන් සදාකාලයටම ඔබ අපේ ශක්තියද, නියමුවාද වුව මැනව. ආමෙන්.

## භාවනාව හා ගැඹුරු දේව සබඳතාවය

ආදර දුවේ පුතේ, කතෝලික භාවනාව ගැන ශිරෝමා පැව්දි සොයුරිය ඔබට කථා කරනවා. මේ ගැන හොඳ අවබෝධයක් ඇති කර ගන්නට ඔබ උත්සහ කරන බව අපේ විශ්වාසයයි. භාවනාව යන වචනය ඇසෙන විට අප කවුරුත් සිතන්නේ භාවනා කරන්නේ බෞද්ධ හා හින්දු බැතිමතුන් බවයි. එය වැරදි ආකල්පයක්. කිතුනු අපටත් භාවනා කළ හැක. මෙම ලිපිය තුළින් ඔබ සමග බෙදා ගන්න උත්සහ කරන්නේ භාවනාව තුළින් අබ්බා පියාණන් වහන්සේ සමග සම්බන්ධවන ආකාරය පිළිබඳවයි.

භාවනාව නිහඬ යාච්ඤාවට යොමු කරන ක්‍රම වේදයකි. ප්‍රධාන වශයෙන් යාච්ඤා කළ හැකි ක්‍රම තුනක් ඇත.

**1. පොදුවේ කරන යාච්ඤා**

**2. පෞද්ගලික යාච්ඤා (වචන සමග)**

**3. නිහඬ යාච්ඤා (වචන සමග)**

මා මෙම ලිපිය තුළින් බෙදගන්නේ නිහඬ යාච්ඤාව පිළිබඳවයි. නිහඬ යාච්ඤාව පෞද්ගලිකව හෝ කණ්ඩායමක් වශයෙන් කළ හැක. ජේසු සමිඳුන් නිහඬ යාච්ඤාවේ යෙදුනු අවස්ථා කිහිපයක් සිහිපත් කර ගනිමු.

**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැව්දි සොයුරිය**

පසුගිය ලිපිය හා සබැඳේ

## ජේසුව පළමු වරට ලබන ළමුන් වෙනුවෙන්මයි.

### පුංචි මරීනා ජේසු ලැබූ දා

බයිසිකලය මරීනගේ මිදුලටම ආවා. මරීනාගේ එක අතක විස්කෝතු මුල අනිත් අතේ සුදු ඉටි පන්දම නංගියි මල්ලියි ඉස්සරහට දුවගෙන ආවා. මරීනා විස්කෝතු මුල ඒ දෙන්නට දුන්නා. පුංචි මරීනා ගේ දෙසට යනකොට අම්මා දවල් ආහාරය පිළියෙල කරමින් හිටියා. මරිනා දැක්ක ගමන් අම්මා අඬන්න පටන් ගත්තා. මරීනාත් අම්මාව බදාගෙන ඇඬුවා. නංගියි මල්ලිත් විස්කෝතු කකා ඇඬුවා. පුංචි මාමාත් ඇස් වල කඳුළු පුරවාගෙන අම්මාට රහසින් යමක් කීවා. ඒ කියන්න ඇත්තේ පුංචි මරීනගේ හදිසි සූදානම හා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ සිද්ධිය ගැනයි.

වැඩි වෙලාවක් ගියේ නෑ. මරීනාගේ තාත්තත් කුඹුරේ වැඩ කරලා එතැනට ආවා. අම්මයි මාමයි මරීනගේ ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද ලැබීමේ කතන්දරය තාත්තට කීව්වා. හැම දෙනාම එකතු වෙලා රෑ කෑම පිළියෙල කළා. හැන්දෑවේගෙන එද්දි ළඟ ගෙදරක ඉන්න ආච්චියි සීයයි පුංචි තෑග්ගක් අරගෙන පුංචි මරීනව බලන්න ආවා.

මේ සුබාරංචිය අහලා පුංචි මරීනා ගේ ගමේ ඉන්න යාළුවොත් එතැනට ආවා. ඒ අය හිස් අතින් ආවේ නෑ. වැඩි හරියක්ම ගමේ යාළුවෝ බෞද්ධ. පුංචි මරීන ඒ අයට දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ලබා ගත් ආදර ජේසු ගැන කියා දුන්නා. මේ කට්ටියම එකතු වෙලා පුංචි මරීන දිව්‍ය සත්ප්‍රසාද ලැබූ දිනයේ රාත්‍රී ආහාරය අනුභව කරන්න සූදානම් වුණා. පුංචි මරීනට පියතුමා කියා දුන්න ''අන්තිම රාත්‍රී භෝජනය '' පිළිබඳ කථාව ''මා සිහිකිරීම පිණිස මෙය සිදු කරන්න'' යන උතුම් වචන දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීමේ සිද්ධිය ජේසු ගේ ගෝලයන් සමඟ අන්තිම රාත්‍රී භෝජනය වැළඳු හැටි, මේ හැම දෙයක්ම ඇගේ සිහියට නැගුණා.

පුංචි මරීනාට හරිම සතුටුයි. උදේ ආදරයෙන් ලබා ගත්ත දිව්‍ය සත්ප්‍රසාදික ජේසුගේ ආදරය දවස පුරාම අත්දකින්න ලැබීම ගැන පවුලේ සැමගේ ආදරණීය සැලකිල්ල තුළ, ඒ අයගේ සමගිය හා අවංක එකමුතු කම තුළ ආදරවන්ත මිතුරන් ගේ අවංක මිතුදම තුළ ජේසුගේ ආදරය පුංචි මරීනා එදා දවස තුළ අත්දැක්කා. පුංචි මරීනගේ ජේසු ලැබූ දවස අපි කාටත් මහඟු ආදර්ශයක්. එදා රෑ පැවති පුංචි සාදයේ රස බොජුන් තිබුණේ නෑ. ඒ වෙනුවට එහි තිබුණේ හරිම චාම් බවක්. සරල බවක්, අද දිව්‍ය සත්ප්‍රසාද ලබන ළමයි අකමැති සමහර වැඩිහිටියන් පමණක් ප්‍රිය මනාප ඒ අයගේ රස නහර පිනවන රසමසවුල් මත්පැන් එහි පෙනෙන්නවත් තිබුණේ නෑ. අද ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද ලබන අහිංසක පුංචි දරුවන් ඔවුන්ට ඔරොත්තු නොදෙන සාද කන බිහිරි කරවන තරමට සංගීතය, නැටුම් ගැයුම් වැනි පිටස්තර ආටෝප වලින් හෙම්බත්වෙලා නිදි වදිද්දි එදා පුංචි මරීන හරිම සැහැල්ලුවෙන් සතුටෙන් නින්දට වැටුණා. ඇ නින්දෙන් පවා ඇගේ ජීවිතයේ සතුටුම දවස ගැන සුන්දර සිහින මවමින් තව තවත් ජේසුට ළං වුනා.

එල්සි මුදලිගේ නැන්දාගෙන්

# මටත් පියතුමෙක් වෙන්න ආසයි !



පසුගිය ළමා ප්‍රදීපයේ ( 2013 සැප්තැම්බර් 02 වන සඳුද ) මුල් පිටුව හා අග පිටුව සරසා තිබූ ජීවමාන පින්තූර පෙළ ඔබ සැම දකින්න ඇතිනේද? ඒ එක්කම සංස්කාරක පියතුමා ඒ සම්බන්ධව ඔබ සැම අමතා කතුවැකිය මගින් ගෙන දුන් අගනා පණිවිඩයත් කියවන්න ඇති නේද? ඒ ගැන ඔබට ඇතිවුන හැඟීම් මොනවාද කියා මං අහන්නේ නෑ. නමුත් එය පිළිබඳ මට ඇතිවුන හැඟීම් මෙසේ ලියන්න අදහස් කළා.

''ගොයම බහුලය ගොවිහු විරලය'' මෙය නිතර අප පූජක - පැවිදි තුමන්ලා විසින් උපුටා ගන්නා උත්කෘෂ්ඨ පාඨයක්. බයිබලයේ වදනක්. මෙය සැබවින්ම සත්‍යයක්. එය ලොවේ කතෝලික ජන අනුපාතය පමණක් නොව අප රටේ සැම මීසමකම කතෝලික සැදැහැවතුන් හා පූජක තුමන්ලාගේ අනුපාතය ගෙන බැලුවත් පැහැදිලිවම පෙන්නුම් කරයි.




අද අප රටේ බොහෝ දෙමාපියන්ගේ බලාපොරොත්තුව තම දරුවා ඉංජිනේරුවකු, වෛද්‍යවරයකු, ගණකාධිකාරිවරයකු හෝ නීතිඥවරයකු කරවීමයි. දෙමාපියන්ගේ එම අභිලාශය ඉටුකරදීමට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් වුවත් දරුවාද මුළු තම ශක්තිය යොදවයි. පවතින තරගකාරී සමාජය තුළ මෙහි වරදක් ඇතැයි කීමට නොහැකිය. නමුත් පැවිදි දිවියක් පූජක දිවි පෙවෙතක් සඳහා සිහින දකින්නෝ අප ළමා සමාජයේද නැතුවා නොවේ. එවන් සිහින වඩාත් සාක්ෂාත් කරගැනීම සඳහා සුසිත් සිත් ඇති දරුවන්ගේ සිත් සතන් පුබුදුවාලීමට මෙම සිද්ධි දමය උත්ප්‍රේරකයක් වූවාට සැක නැත. තම හදපත්ලෙන්ම පැනනැගුන අවංක අදහස් හැඟීම් බරව ෆ්‍රැන්සිස් සුදතුමි පියාණන් තරයේ වැළඳගෙන පැවසීමට තරම් මේ පුංචි නේතන් ද බ්‍රිටෝ උත්සුකවූයේ පූජකවරයේ ඇති උත්තරීතර බව ඔහු වටහාගෙන සිටි නිසා නොවන්නේද? මේ සිද්ධිය තුළින් උත්තේජනය ලබන ලොවේ ළමා පරපුර වැඩි වැඩියෙන් දැහැමි බවින් පූජක පැවිදි දිවියට අවංකවම කැපවීම තුළ මිහිපිට දේවරාජ්‍ය ගොඩනැංවීම වැඩි ඈතක නොවන වග පැහැදිළිව දක්නට ලැබේ.එදින ළමා ප්‍රදීපයේ සංස්කාරක පියතුමාගේ කතුවදනේ අවසන් වදන් කීපයකින් මෙයද අවසන් කරමි.....

''ආදර දුවේ, පුතේ, අපටත් ජීවිතයේ ධාර්මික අරමුණක් තිබෙන්න ඕනා. එය අන් අයට ආදර්ශයක් බවට පත් කරන්න ඕනා. පුංචි බ්‍රිටෝ මුළු මහත් ලෝකයටම පෙන්වූයේ ඒ ධාර්මික වීරත්වයයි. ඔබත් සුදනම් විය යුතුයි, ඒ ධාර්මික වීරත්වයේ කුඩා දහම් තානාපතිවරයෙක් / තානාපතිවරියක් වන්නට. ඒ සඳහා පුංචි බ්‍රිටෝවත් ආදර්ශයට ගන්න''.

**සිරිල් පෙරේරා මාමා**

# හලාවත පදවියේ බෝලවත්ත හා වෙන්නප්පුව දිසා ළමුන් සඳහා පෝෂක වැඩසටහනක්





හලාවත පදවියේ බෝලවත්ත හා වෙන්නප්පුව දිසාවන් හි ළමුන් සඳහා ''යොවුන් වියට අභියෝගයක් වු ජනසංනිවේදනය හා ලිංගිකත්වය'' පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වුණි. මීසම් 24 ක, 9 සිට 11 ශ්‍රේණි දක්වා ළමුන් 1500 ක් පමණ මීට සහභාගිවූ අතර නයිනමඩම , නාත්තන්ඩිය , තොඩුවාව , වෙන්නප්පුව හා කටුනේරිය ප්‍රදේශයන් හිදි මෙම වැඩ සටහන් පැවැත්වුණි. මේ සඳහා දේශකයින් ලෙස වෛද්‍ය ඩේමියන් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා , වෛද්‍ය නිලාන් රත්නායක , තුෂාරා රත්නායක , සුපුන් පෙරේරා, මහාචාර්ය ඇන්ටන් මීමන, සංජීවා ප්‍රියදර්ශනී, මාධ්‍යවේදි වික්ටර් අයිවන් හා කුමර නයනජිත් යන අය එක් වූහ. හලාවත පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු නෙල්සන් සමන්ත, ධර්මදූත අධ්‍යක්ෂ ගරු නිශාන්ත ජානක, ළ.ක්‍රි.වි අධ්‍යක්ෂ ගරු සිසිර කුමාර යන පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් මෙහි කටයුතු සංවිධානය කෙරිනි. මෙයට සහභාගි වු ළමුන් සේයාරුවෙහි දිස්වේ. **(කොකුම් වාසනා)**

පුංචි අපේ කියුම් කෙරුම්

# තුම්මෝදර මීසමේ ධර්මදූත ළමා සමාජය ඇරඹේ




තුම්මෝදර මීසමේ ධර්මදූත ළමා සමාජය පසුගියදා ආරම්භ කෙරිණි. මීසම් සේවක ගරු ප්‍රැන්සිස් පුල්ලේ පියතුමාගේ අනුශාසකත්වයෙන් සජීවකයින්ගේ මෙහෙයවීමෙන් සමිතියේ කටයුතු සිදු කෙරේ. ධර්මදූත ළමා සමාජයේ සාමාජික පිරිස ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ අයුරු. **(රේණුකා ප්‍රියන්ති සිල්වා)**

# වැල්ලවාය දහම් ළමෝ චාරිකාවකට එක්වෙති




වැල්ලවාය ශු. මරියා දහම් පාසලේ ළමෝ පසුගියදා එක්දින චාරිකාවකට එක් වූහ. මෙහිදී ළමුන් හපුතලේ ''ඇඩිෂම්'' තාපසාරාමය බණ්ඩාරවෙල ''සිදු පියනිල'' දෙව්සත්හල හා බණ්ඩාරවෙල ඇල්ලේතොට දිළිඳු ක්ලාරා කන්‍යාරාමයද නැරඹීය. මීසම් සේවක ගරු හේමන්ත පීරිස් පියතුමාගේ මඟපෙන්වීම යටතේ මෙම චාරිකාව සංවිධානය කෙරිණි. මීට සහභාගි වූ ළමෝ ළමා ප්‍රදීපය සඳහා ඇඩිෂම් කන්‍යාරාමය ඉදිරිපිටදී සමූහ සේයා රුවකට මෙසේ මුහුණ දුන්හ. **(ශ්‍රී කාන්ති ගුණවර්ධන)**




කොළොන්නාව මීසමේ ධර්මදූත ළමා සමාජයේ ළමෝ 60 දෙනෙකුට ස්ථිර සාමාජිකත්වය ලබාදෙමින් පදක්කම් පළඳවනු ලැබීය. ධර්මදූතභාර ජාතික අධ්‍යක්ෂ ගරු රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමාගේ ප්‍රධානත්වයෙන් කොළොන්නාව මීසම් සේවක ගරු ජූඩ් ක්‍රිෂාන්ත පියතුමාගේ සහභාගිත්වයෙන් කොටිකාවත්ත අවිලාහි ශුද්ධවූ තෙරේසා දෙව්මැදුරේ දී පදක්කම් ප්‍රදානය සිදු කෙරිණි. පදක්කම් පැළඳී ළමුන් ගරු පියතුමන්ලා පැවිදි සොයුරිය හා සජීවක ගුරුතුමිය සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **(ආර්. ජෝශප් ප්‍රිය)**

# තොඩුවාව දහම් ළමුන්ට විශේෂිත දෙසුමක්

තොඩුවාව මීසමේ දහම් පාසලේ 8 ශ්‍රේණියේ සිට ඉහල දූ පුතුන් සඳහා විශේෂිත දෙසුමක් 2013 සැප්තැම්බර් 28 වන සෙනසුරාදා තොඩුවාව සා. අන්තෝනි මුනි දෙව් මැදුරේදී පැවැත්වේ. ''යහපත් කිතුනු දරුවන් වෙමු අපි '' තේමාව යටතේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතා මෙම දෙසුම මෙහෙයවයි. තොඩුවාව මීසම් සහයක ගරු දුෂාන්ත පෙරේරා (සා.බෙ.නි) පියතුමන්ගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

# ළමා ලේඛක වැඩමුළුව

## හලාවත පදවිය

හලාවත පදවියේ මාදම්පේ මීසමේ දහම් ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2013 සැප්තැම්බර් 29 වන ඉරුදින මාදම්පේ සා. සෙබස්තියන් දෙව්මැඳුරේදී පැවැත්වේ

දහම් පාසලේ 6 ශ්‍රේණියෙන් ඉහළ ළමුන් සඳහා පැවැත්වෙන මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛක කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු සිසිර කුමාර පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ.

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

**දෙවන තේමාව ඇසුරින් - (දේව වරප්‍රසාද ලබාදෙන සක්‍රමේන්තු)**

**කතෝලික ධර්මය II ප්‍රශ්න පත්‍රයේ අනිවාර්ය ප්‍රශ්නය සඳහා ඉදිරිපත් වූ ප්‍රශ්න එකතුව (2008 - 2012)**

**19. ජන වන්දනාවේ ප්‍රධාන කොටස් දෙකක් ලියන්න. (2008/03)**

★ දිව්‍ය පූජාව ★ දේව ප්‍රසාද නිධාන

**20. ජීවිතයේ එක් වරක් පමණක් ලබා ගත හැකි දේව ප්‍රසාද නිධානවල පොදු ලක්ෂණ දෙකක් නම් කරන්න. (2011/04)**

★ ශුද්ධ වූ ක්‍රිස්මා (ක්‍රිසම්) තෛලයෙන් ආලේප කිරීම
★ ආත්මයේ නොමැකෙන ලාංඡනයක් සටහන් වීම

**21. ඇදහිල්ල වර්ධනය කර ගැනීම සඳහා කළ යුතු කාර්ය දෙකක් ලියන්න. (2011/03)**

★ දිව්‍ය පූජාවට සහභාගිවීම ★ දේව ප්‍රසාද නිධාන ලබාගැනීම
★දිනපතා යාච්ඤා කිරීම ★ වන්දනා ගමන් යාම

**22. කිතුනුවාට මෙලොව අයත් වන ජීවිත තත්ත්ව දෙකක් ලියන්න. (2011/05)** ★ තනිකඩ දිවිය ★ පූජක දිවිය
★ විවාහ දිවිය ★ පැවිදි දිවිය

**23. ප්‍රසාද ස්නාපනයේ සක්‍රමේන්තුව මගින් ලැබෙන පොදු පූජකවරය තුළින් පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න. (2009/05)**

★ දිවැසි කාර්යය ★ පූජක කාර්යය ★ එඩේරික කාර්යය

**24. පොදු පූජකවරය මගින් ක්‍රිස්තුන් වහන්සේගෙන් ගිහියා ලබා ඇති දිවැසි කාර්යයන් දෙකක් නම් කරන්න. (2012/04)**

★ දහම් පාසල් වල ඉගැන්වීම
★ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අන් අයට කියා දීම සහ ජීවත් කරවීම

**25. ජලයෙන් බව්තිස්ම නොලැබුවත්, දේව රාජ්‍යයට පිවිසෙන කණ්ඩායම් දෙකක් නම් කරන්න. (2011/08)**

★ විශ්වාසය වෙනුවෙන් දිවි පිදූ අය
★ සභාව නොදැන හෝ වරප්‍රසාද ජීවිතයක් ගත කරන අය
★ ක්‍රිස්තියානි වීමට සූදානම් අය

**26. ආරම්භක ප්‍රසාද නිධාන අතුරින් දිව්‍ය සත්ප්‍රසාදයට විශේෂ තැනක් හිමිවන්නේ ඇයි?. (2008/07)**

★ ක්‍රිස්තුන් වහන්සේ ජීවමානව දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩ සිටීම

**27. ඉශ්රායෙල් ජනතාව පොරොන්දු දේශයට යන ගමනේදී දෙවියන් වහන්සේ ඔවුන් පෝෂණය කළ ආහාරයත්, නව ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළ භෝජනයත් වෙන් වෙන්ව නම් කරන්න. (2010/02)**

★ පුරාණ ගිවිසුමේ දී ''මන්නා'' නැමති ආහාර මගින්
★ නව ගිවිසුමේදී දිව්‍ය සත්ප්‍රසාදය (දිව්‍ය ශ්‍රීපූජය හා ශ්‍රීරුධිරය මගින්)

**28.දිව්‍ය සත්ප්‍රසාද ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (2011/07)**

★ තුති පිදීමේ පිළිවෙතකි ★ ස්වාමීන් වහන්සේගේ භෝජනය
★ පූප කැඩීමකි ★ සහභාගිකමේ භෝජනය

**29. අන්තිම රාත්‍රී භෝජනයේදී ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද සක්‍රමේන්තු දෙක නම් කරන්න. (2012/08)**

★ දිව්‍ය සත්ප්‍රසාදය ★ පූජකවරය

**30. ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වයට නතුවූ ඔබේ ජීවිතයට ලැබී තිබෙන ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න. (2008/06)**

★ ප්‍රඥාව ★ තේරුම් ගැනීම ★ දැනගැන්ම

**31. ආශිර්වාදකාර බන්ධනයේ ස්ථිරත්වය ගැන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම කුමක් ද?. (2009/04)**

★ දෙවියන් වහන්සේ එක්කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා. (මාක් 10/9)

**32. කතෝලික විවාහයට ඇති බාධා දෙකක් නම් කරන්න. (2010/09)**
★ ලේ නෑකම් ★ මිශ්‍ර ආගම්

**33. පූජකවරයේ සක්‍රමේන්තුව දානය කිරීමේ පිළිවෙත තුළ දැකිය හැකි ප්‍රධාන අංග දෙකක් ලියන්න. (2009/02)**

★ රදගුරුතුමා විසින් අපේක්ෂකයාගේ හිසමත අත්තබා යාච්ඤා කිරීම
★ ක්‍රිස්මා තෛලයෙන් අපේක්ෂකයාගේ දෑත් ආලේප කිරීම

**34. ශුද්ධවූ සභාව ජනවන්දනාව තුළ අද්විතීය ලෙස සමරන මෙහෙය කුමක්ද? (2010/08)**

★ පාස්කු අභිරහස මගින් ක්‍රිස්තුන් වහන්සේගේ ගැළවීමේ කාර්යය උත්සවාකාරයෙන් පැවැත්වීම (දිව්‍ය පූජා යාගය)

**35. රදගුරු තුමාගේ කාර්යභාර දෙකක් ලියන්න. (2011/06)**

★ ශුද්ධවූ සභාව තුළ ඉගැන්වීම ★ පාලනය කිරීම
★ ශුද්ධවන්ත කිරීම
★ ආශිර්වාදකාර බන්ධනය හැර සියලුම දේව ප්‍රසාද නිධාන දානය කිරීම

**ගරු ඩේමියන් පෙරේරා පියතුමන් විසිනි.**

**ඉතිරිය ලබන සතියේ .....**

# ළමා කතා ලියූ ක්‍රිස්තියානි විශ්ව ලේඛකයෝ 02

## ''එකමත් එක කාලෙක''
## ළමා සුරංගනා කතා ලෝකෙට හඳුන්වා දුන් ක්‍රිස්තියානි ලේඛකයන් තිදෙනා


ඇන්ඩර්සන් කුඩා කල සිටම සුරංගන කතා කෙරෙහි දැක් වූයේ පුදුම ඇල්මකි. මෙවැනි කතා කෙරෙහි ඔහු සිත නොදැනුවත්වම යොමු කළේ සිය පියා යි. නින්දට යෑමට පෙර පියා විනෝදය සඳහා අරාබි නිසොල්ලාසය හඬ නඟා කියවීම සිරිතක් කර ගෙන සිටියේ ය. ඔහු මේ කතා හඬ නගා කිය වූයේ බිරිඳටත් රස වීඳීමටයි. එහෙත් ඒ වෙනුවට කාටත් හොරෙන් ඒ කතාවලට කුඩා ඇන්ඩර්සන් ද සවන් දුනි. ඔහු නිදා සිටින බවක් හඟවා දිනපතා ම කතාවලට සවන් දුන්නේ ය. එකල ඩෙන්මාර්කයේ ජන කතා හා ජන ප්‍රවාද බෙහෙවින් ම ප්‍රචලිත විය. කුඩා ඇන්ඩර්සන් රෙදි වියන ස්ත්‍රීන් ද, මහලු ස්ත්‍රීන් ද මේ කතා කියනවා අසා ගෙන උන්නේ ය. ඔහු ඒ කතාවලට සවන් දීමෙන් ලැබුවේ විශාල ආස්වාදයකි.

එහෙත් ඇන්ඩර්සන් සුරංගනා කතා කෙරෙහි සිත් යොමු කළේ කලකට පසු යි. ඔහුගේ මුල් ම ග්‍රන්ථය 1822 දී පළ විය. ''තරුණ වියේ උත්සාහ'' නම් ඒ පොත එතරම් ජනප්‍රිය නො විණ. ''මිය යන දරුවා'' නමැති කාව්‍යය ඔහුගේ දෙවැනි කෘතිය විය. 1829 දී ඔහුගේ එක් සිහිනයක් සාර්ථක කරමින් රාජකීය නාට්‍ය ශාලාව ඇන්ඩර්සන් රචනා කළ නාට්‍යයක් රඟ දැක්වීය . එහෙත් ඔහුගේ පැරණි පින මතු වී ගෙන ආවේ තම ප්‍රථම නවකතාවත් සමග ය. එය ජනප්‍රිය විය.

ඉංග්‍රීසියට හා ජර්මන් බසට ද පෙරලනු ලැබීය. ඔහුගේ සිත නැවතත් නොදැනුවත්ව ම වාගේ සුරංගනා කතා කෙරෙහි යොමු විය. 1835 දී ඔහු දරුවන් සඳහා මෙවැනි කතා හතරක් රචනා කර පළ කළේය. ඇන්ඩර්සන්ගේ වාසනාව පෑදිණි. ළමෝ ඔහුගේ කතා කියවීමට පොර කෑහ. ඩෙන්මාර්කයේ කුඩා දරුවන්ගේ ධෛර්යයෙන් ඔදවැඩී ගිය ඇන්ඩර්සන් සෑම වසරකම නත්තල් සමයට ඔවුනට අලුත් පොතක් ලියා දුන්නේ ය. මේ තැන් සිට වසර තිස් හතක් යනතුරු සෑම නත්තලකටම අලුත් සුරංගනා කතා පොතක් ඔහුගේ අතින් ලියැවිණ. 1872 වන විට ඔහු අතින් ලියැවුණු කතා 168 ක් වූහ.

මේ වන විට ඔහුගේ කතා ඩෙන්මාර්කයට සීමා කර තැබීමට නොහැකි විය. මුලින් එක් රටක්, දෙකක් පසු ව රටවල් හත අටක්, දහයක්, පහලොවක් ඔහුගේ කතා තම රටවල සිඟිත්තන්ගේ කතා බවටද පරිවර්තනය කර ගත්හ. පිටරටවල ළමා ළපැටියෝ ද ඔහුගේ කතා මහත් අභිරුචියෙන් කිය වූහ. ඇන්ඩර්සන්ගේ සුරංගනා කතා දැන් භාෂාවන් 80 කට පමණ පරිවර්තනය වී ඇත.

ඇන්ඩර්සන් මේ කතා බොහොමයකට පිටුතලය සොයා ගත්තේ තමාගේ ම අත් දැකීමෙනි. තමාට විඳින්නට වූ දුක් ගැහැට, ගැන සිහි වූ ඔහු ''අවලස්සන තාරා පැටවා'' ලිව්වේය. තම පියා පසුතලය කර ගෙන ''රතු සපත්තු'' රචනා කළේය. මව සිහි වී ''කුඩා ගිනිපෙට්ටි කෙල්ල'' ලීවේ ය. ඔහුගේ කතා වරෙක දුක්සහිත විය. වරෙක සතුට දනවන සුලු විය. වරෙක උපහාසාත්මක වී ය. කවුරු පසුතලය කර ගෙන ලීවත් මේ කතා තුළ සැමටම පොදු මානුෂික ගුණයක් විය. ඒවා ලොව ඕනෑ ම තැනකට ඕනෑම කලකට ගැලපෙන සුලු වීය. අද වුවත් මේ කතාවල ඇත්තේ නැවුම් සුවඳකි. මේ කතා කුඩා ළමුන්ට මෙන් ම වැඩිහිටියන්ට ද එක සේ ප්‍රියජනක වූයේ එබැවිනි. මේවා සුරංගනා කතා වුවත් කලාත්මක ගුණයෙන් පරිපූර්ණ විය. ''රජතුමාගේ අලුත් වස්ත්‍රය'' නමැති කතාව හාස්‍යය, උපහාසය හා මානුෂික ගති ගුණ පිළිබිඹු කරන කැඩපතක් වැනි විය.



වංක මිනිස්සු කිහිප දෙනෙක් රටේ රජුට නව වස්ත්‍රයක් වියා දෙන බවට පොරොන්දු වූහ. මෙම වස්ත්‍රය කෙතරම් ලක්ෂණ වේද කිවහොත් එය මෝඩයන් හැර වෙන කිසි කෙනෙකුට නොපෙනෙන බවද ඔව්හු කීහ. රෙදි වියන යන්ත්‍රයේ නූල් කිසිවක් නොවීය. රජ සහ ඇමතිවරු එහි වියා තිබෙන රෙදි මහත් සේ ප්‍රශංසාවට භාජනය කළහ. වස්ත්‍රය අවසන් වූ පසු රජතුමා එය පැළඳ ගෙන වීථි සංචාරය කළේය. කවුරු කවුරුත් අලුත් වස්ත්‍රයේ ලස්සන වර්ණනාට වූහ. එහෙත් එක් සිඟිත්තෙක් මවට කතා කොට අම්මේ ''රජ්ජුරුවන්ගේ ඇඟේ මොනවත් නැහැ නේ'' කීවේය. මිනිස් දුර්වලකම් කියා පාන මෙවැනි කතා බෙහෙවින් ජනප්‍රිය විය. මොහුගේ කතාවල අප්‍රාණික වස්තුවලට පණ එයි. ඉදිකට්ටක් කතා කරයි. ගස් සහ සත්තු මිනිසුන් මෙන් හැසිරෙති. ඔහු මවා පෑවේ සුරංගනා ලොවක් වුවත් ඒ ලොව අපේ මිනිස් ලොවට ගතිගුණ, ගති පැවතුම් , අදහස් උදහස්, ක්‍රියාවන් අතින් බෙහෙවින් ම සමාන විය. ඔහු මේ කතා කීම සඳහා උචිත ශෛලියක් යොදා ගත්තේ ය. එනම් කතා කරන භාෂාවයි. ලිඛිත ග්‍රන්ථයකට කතා කරන භාෂාව යොදා ගත් මුල් ඩෙන්මාර්ක් ජාතිකයා ඔහු විය. මේ නිසා ම ඔහුගේ කතාවල රසය තවත් තීව්‍ර විය.

ලක්ෂමන් වික්‍රමසිංහගේ
ලිපියකින් කරුණු උපුටා ගැණිනි.

**සංස්කාරක පියතුමන් විසිනි**

(ලබන සතියට )

# පාකින්සන් රෝගයේ මිදුම්කරුවාණෝ

# භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු මුනි

**අති උත්තම දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා කාලයක් තිස්සේ පාකින්සන් රෝගයෙන් පීඩා විඳ සද සාමය දිනා ගත්තේය. මේ වනවිට එතුමන්ගේ මධ්‍යස්ථකමින් පාකින්සන් රෝගයෙන් පීඩා විඳින රෝගීන් සුවය ලබා ගැනීමේ සිද්ධීන් ලොව විවිධ රටවලින් වාර්තාවේ.**



පාකින්සන් රෝගයෙන් සම්පූර්ණයෙන් සුවය ලැබූ ගරු මාරි පියෙරේ සොයුරිය

අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුනිසුරාණන් භාග්‍යවරයට ඔසවාලීමට **ප්‍රංශ ජාතික ගරු මාරි සිමොන් පියෙරේ පැවිදි සොයුරියගේ** පාකින්සන් රෝගය අරුම පුදුම ලෙස සුවපත් වීමේ ප්‍රාතිහාර්ය හේතුවිය. 2005 දී සගසැපත දිනූ අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුනිසුරාණන්ගේ ආත්මයට සග සුව පතා යදින අතරේම එතුමිය සිය රෝග යට එතුමන්ගේ මධ්‍යස්ථකමින් සුවය පතා යාච්ඤා කළාය. 46 හැවිරිදි ගරු මාරි සිමෝන් පැවිදි සොයුරියද මේ රෝග යට ගොදුරු වූවාය. ඇවිදීමට , ලිවීමට , රිය පැදවීමට නොහැකිවන තරමට රෝගය බරපතල වූ අතර ඇගේ වම් අත මුළුමනින්ම අඩපණ විය.

2005 අප්‍රේල් මස සසුන් පියා සගසුව දිනීමෙන් පසු ජුනි මස දී තමන්ව රාජකාරි වලින් මුද හරින්නැයි ඉල්ලා සිටි විට ප්‍රධාන මවුතුමිය කොළයක් ගෙන දෙවන ජුවාම් පාවුළු යන නම අභ්‍යාසයක් ලෙස ලියන්නට දුන්නාය. එහෙත් රෝගය නිසා අකුරු අපහැදිලි විය. කිසිවකුට කියවාගත නොහැකි විය. කාලයාගේ ඇවෑමෙන් එක් දිනක් ගරු පැවිදි සොයුරිය සිය කාමරයේ සිටිද්දි ''ගන්න ඔබේ පෑන .....දැන් ලියන්න පටන් ගන්න'' යන හඬක් ඇසිණි. රෝගී බව නිසා ලිවීම මුළු මනින්ම අත් හිටුවා තිබූ ඇය බැරිම තැන නැගිට ලියන්නට පටන් ගත්විට අකුරු පැහැදිලිව ලියන්නට හැකි විය. වම් අත අඩපණව තිබූ තත්ත්වයෙන් මිදී වෙව්ලීම නතරව තිබීම නිසා එතුමිය සහෝදර පැවිදි සොයුරියකට ඒ බව පෙන්වූවාය. ශ්‍රේෂ්ඨයන්ගේ අවසරය මැද සිය විශේෂඥ වෛද්‍යවරයා හමුවන්නට ගිය විට ඔහු විමතියෙන් බලාසිට මෙසේ විමසුවේය. ''මොකද්ද වුණේ - බෙහෙත් දෙගුණයක් ගත්තාද? '' ''නෑ දොස්තර මහත්තයෝ ....මං ඒවා ගැනීම සම්පූර්ණයෙන් නැවැත්තුවා. මේක දෙවැනි ජුවාම් පාවුළු සසුන් පියාගෙන් ලද තෑග්ගක්. රෝගය තබා ඒ ගැන ලක්ෂණයක් වත් නැහැ. මට නම් මේක විස්තර කරන්න බැහැ. විශේෂඥ වෛද්‍ය මතය විය.

ගරු මාරි සිමොන් පැවිදි සොයුරියට නම් එය දෙවන උපතක් විය. සභාව විද්‍යාව කෙරේ බලවත් ගෞරවයක් දක්වන නමුත් විද්‍යාත්මක හේතු දැක්වීමකින් විස්තර කළ නොහැකි මෙබඳු සිද්ධීන් ගැන ඉතා විමසිල්ලෙන් පරීක්ෂා කරයි. මුළුමනින් සුවය ලැබීම, වෛද්‍යවරුන්ට එය විස්තර කළ නොහැකි වීම, ක්ෂණික හා මිනිස් මොළයට වටහා ගත නොහැකි වීම ආදිය මත සභාව මෙය ප්‍රාතිහාර්යයක් බවට තීරණය කරයි. ඒ අනුව අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියා භාග්‍යවරයට එස වීමට මේ සිදුවීම පාදක විය.

මේ අතර **කොළොම්බියාවේ පුයිලා හි නගරාධිපතිව සිටි මාර්කෝ ෆිඩෙල් රොජාස්** 2005 දෙසැම්බරයේ මුල්වරට රෝගී විය. වෛද්‍ය පරීක්ෂණ ගණනාවකින් පසු නිගමනය වූයේ පාකින්සන් රෝගය ඔහුට වැළඳී ඇති බවයි. ක්‍රම ක්‍රමයෙන් රෝගය සිරුර ආක්‍රමණය කළ අතර මහමාර්ගයේ යද්දි ඔහු ඇද වැටුණේය. වරක් ටැක්සියක් ඔහු මතින් ගියේය. මෙසේ රෝගීව සිටි ඔහුට 2010 දෙසැම්බර් 27 වැනිද සන්ධ්‍යා යාමයේදී

## ඔබ දන්නවාද?




**1. රට රටවල භාවිත වන මුදල් වර්ග මොනවාද**

**කියුබාව (ඇ ඩොලර්) ලිබියාව (ලිබියා ඩිනාර්) නේපාලය (නේපාල රුපියල් ) පැපුවානිව්ගිනියා (කිනා) දකුණු අප්‍රිකාව (රැන්ඩ්) සිම්බාබ්වේ (ඇ.ඩොලර්) නිව් කැලිෆෝනියා (CFP ප්‍රැන්ක්) හංගේරියාව (ෆිටින්ට්) සී ෂෙල්ස් (සිසේල්ස් රුපියා) රිපබ්ලික් ඔෆ්කොරියා (කොරියන් වෝන්) ෆීජී (ෆීජී ඩොලර්) ජැමෙයිකා (ජැමෙයි කානු ඩොලර්) ඉතියෝපියාව (බීර්) බුර්කිනා ෆිසෝ (CFA ප්‍රාන්ස් ) ඉරානය (ඉරානියන් රියාල්) ඉරාකය (ඇමෙරිකානු ඩොලර්)**

**ඉදිරිපත් කිරීම
මැක්සිමස් රෝයි පෙරේරා මාමාගෙනි.**

කිතුනු උරුමය



වරක් රෝමයට ගිය අවස්ථාවකදී දිව්‍ය පූජාවෙන් පසු අති උත්තම දෙවන ජුවාම් සසුන්පියා සමග මොහොතක් කතාබහ කළ අන්දම සිහිපත් විය.

එදින රාත්‍රියේ වේදනාව මැදින් ෆිඩෙල්ට අති උතුම් දෙවන ජුවාම් පාවුළු සසුන් පියා සිහිපත්විය. එතුමාද පාකින්සන් රෝගයෙන් මහත් පීඩා විඳි නිසා ෆිඩෙල් එතුමන්ගේ මධ්‍යස්ථ කම පතා යාච්ඤා කළේය. ''අති උත්තම දෙවන ජුවාම් පාවුළු හිමිපාණෙනි ඔබ වහන්සේ වැඩමකර මා සුව කරන්න. ඔබ වහන්සේගේ දෑත් මගෙ හිස මත තබා සුවකරන්න.'' යැයි නින්දට යනතුරු සිතින් ඉල්ලා සිටියේය. පසුද පහන්වන විට ඔහුගේ රෝගය පහව තිබිණි. වෛද්‍ය ඇන්ටෝනියෝ ෂෙල්සිංගර් පියෙඩ්රිහිටාද ඔහු කෙරෙන් රෝගය පහව ගොස් ඇති බව සහතික කළේය. මෙම සුවය තමා ලැබුවේ භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු මුනිඳුන්ගේ මධ්‍යස්ථකමින් බව මාර්කෝ ෆිඩෙල් එකම විශ්වාසයෙන් පවසයි.



පාකින්සන් රෝගයෙන් සම්පූර්ණයෙන් සුවය ලැබූ මාර්කෝ ෆිඩෙල් රොජාස් හිටපු නගරාධිපති වරයා

**කොස්ටාරිකා හී හෙලෝරිබෙත් මෝරා ඩයස් නම් කාන්තාවගේ**

මොළයේ ඇති අසාමාන්‍ය තත්ත්වය නිසා ජීවත් වන්නේ දින කීපයක් පමණයැයි වෛද්‍යවරු පැවසුහ. ඇය සිය නිවෙසට ගොස් භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු හිමිපාණන්ගේ මධ්‍යස්ථකම පතා ලෙඩ ඇඳේ වැතිර සිටිමින් යාච්ඤා කළාය. කොස්ටාරිකාවේ කාර්ටාගෝ පළාතේ කුඩා කාමරයක වැතිර සිටි ඇය එක්වරම ''නැගී සිටින්න.... බිය නොවන්න ''යැයි හඬක් ඇසිණි. ඇයට ඇඳෙන් නැගිට්ටාය. ඇයට මහත් සුවයක් දැනුණාය. 2011 මැයි මාසයේ මෙය සිදුවිය. කෙසේ වෙතත් එය පිරිපුන් සුවයක් ලෙස වෛද්‍යවරුන් විස්තර කළේ නැත. 2011 අප්‍රේල් මස තදබල හිස රුදවකින් පෙළුනු නිසා ඇයව පරීක්ෂා කළ වෛද්‍යවරුන් රෝගය සොයා ගති. වෛද්‍ය ඇලිජැන්ඩ්‍රෝ වාර්ගස් මේ බව ඇගේ දූ දරුවන්ට විස්තර කර දුනි. මරණ සහතිකය අතේ තබාගෙන සිටින මෝරා වෙනුවෙන් නිවසේ අල්තාරයක් තැනූ ඔවුන් භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු පිය රුව සහිත සඟරාවක කවරයක් ඇයට ලබා දුන්නාය. 'ඒ පින්තූරය මට කතා කළා මං පුදුමයට පත්වුණා. එහෙමයි ස්වාමිනි කියා. මං උත්තර දුන්නා. ඊට පස්සේ මං නැගිට්ටා'. මෝරාගේ සුවය ගැන වෛද්‍ය විද්‍යාත්මක හේතුවක් දැක්විය නොහැකි බව වෛද්‍ය වාර්ගාස් කියන අතර, 'මේ තත්ත්වය මාව විමතියට පත් කළා. මේක නම් ප්‍රාතිහාර්යයක්ම තමයි'. ඔහු පවසයි. 'මගේ විශ්වාසය තව තවත් තහවුරු වුණා'. 'අති උතුම් දෙවන ජුවාම් පාවුළුහිමි මධ්‍යස්ථකමින් මට සුවය ලැබුණා'. ඇය පවසන්නීය.



මොළයේ ඇති අසාමාන්‍ය තත්ත්වයෙන් සුවය ලැබූ මෝරා ඩයස් මහත්මිය

භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු මුනිඳුන් සාන්තුවරයට එසවීමට මේ ප්‍රාතිහාර්යය හේතු සාධක වන බැව් වතිකාන ආරංචි මාර්ග පවසයි. අති උතුම් ප්‍රැන්සිස් සසුන් පියා ඊට අනුමතිය පළකර ඇති අතර දිනය තවම ප්‍රකාශයට පත්කර නැත.

✍ **ශිරාන් මෛත්‍රී**

**මාසික සිතිවිල්ල**



**සේයා :-**
**අශේන් එස්. සේනාරත්න**

**මා සි ක සි ති වි ල් ල**

''සැප්තැම්බර් මාසය''
ළමා ප්‍රදීපය, අංක 02, , ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම
මයිකල් ඇන්ජලෝ
ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 109

## It's time / Had better

යම් දෙයක් "කළා නම් හොඳයි" කියන අදහස සිංහල භාෂාවෙදිත් අපි පාවිච්චි කරනවා නේද?
දැන් ඉතිං ගෙදර ගියා නං හොඳයි
මේ වැඩේ නැවැත්තුව නං හොඳයි
මේ ගැන යමක් කළා නං හොඳයි...

යනාදී වශයෙන් අපි සිංහලෙන් අදහස් පළකරනවා වගේ ඉංග්‍රීසියෙන් ඒ අදහස පළ කිරීමට බොහෝ විට භාවිතා කරන වචන යුගලයක් තමයි Had better සහ It's time කියන වචන.

අපි බලමු කොහොමද ඒ වචන වාක්‍යවල යොදන්නෙ කියලා.
බලන්න මේ වැකි දිහා.
My exam starts at 8 'O' clock'. I have only ten minutes. I'd better go now.
(මයි එග්සෑම් ස්ටාට්ස් ඇට් එයිට් ඕ ක්ලොක්. අයි හැව් ඕන්ලි ටෙන් මිනිට්ස්.
අයිඩ් බෙටර් ගෝ නව්) මේකෙ තේරුම
මගේ විභාගෙ පටන් ගන්නෙ අටට. මට තියන්නෙ තව විනාඩි දහයයි. දැන් ඉතිං ගියා නං හොඳයි.
මෙහිදී ගියා නං හොඳයි කිව්වට ඇත්තටම ඒක ඊට වඩා බරපතල දෙයක් බව ඇඟවෙනවා. නොගියොත් සෑහෙන කරදරයක් පාඩුවක් වෙන්න තිබෙන බවට අනතුරු ඇඟවීමකුත් "I'd better go' කියන එකෙන් පිළිබිඹු වෙනවා.
(මෙතන ඇත්තටම "I'd better" කියන්නෙ "I had better" කියන එකේ කෙටි කිරීමක්) මේ වැකිය බලන්න.

you'd better take an umbrella. it might rain.
(යූඩ් බෙට(ර්) ටේක් ඇන් අම්බ්‍රෙලා. ඉට් මයිට් රේන්)
You'd better = you had better

මේකෙන් අදහස් වෙන්නෙ; කුඩයක් ගෙනියන්න. වහින්න පුළුවන්. මෙහිදී "වහින්න පුළුවන්" කියන අදහස විතරක්ම නෙමේ. "you'd better" කිව්වම අදහස් වෙන්නෙ.
කුඩයක් නොගෙනිච්චොත් ලොකු අමාරුවක වැටෙනවා. වැස්සට තෙමෙන්න තමයි වෙන්නෙ කියන අනතුරු ඇඟවීමකුත් කියැවෙනවා.
ඒ වගේ මේ වැකිය බලන්න.
The petrol tank is almost empty. We'd better stop for petrol.
We'd = We had better
(ද පෙට්‍රල් ටැන්ක් ඉස් ඕල්මෝස්ට් එම්ටි. වීඩ් බෙට(ර්) ස්ටොප් ෆො(ර්) පෙට්‍රල්.) ටැංකිය ඉවර වෙන්න තරමට ඇවිත්. අපි පෙට්‍රල් ගහන්න නැවැත්තුව නං හොඳයි.

මෙතනදීත් පෙට්‍රල් ගහන්න නවත්තමු යෝජනාව එක්කම එසේ නොකළොත් ලොකු කරදරයක්, අපහසුතාවයක් වන බවට අනතුරු ඇඟවීමකුත් සිදුවෙනවා.

you'd better tell him to come today. Tomorrow is too late.
ඔහුට අදම එන්න කියන්න. (කිව්ව නං හොඳයි)නැත්නම් හෙට පමා වැඩියි. (ලොකු පාඩුවක් එයින් විය හැකි බව ඇඟවෙනවා.)

If your hand is paining, you'd better go and see a doctor.
ඉෆ් යුව(ර්) හැන්ඩ් ඉස් පේනිං යූඩ් බෙට(ර්) ගෝ ඇන්ඩ් සී අ ඩොක්ට(ර්) ඔයාගෙ අත කකියනව නං ඉක්මන්ට ගිහින් වෛද්‍යවරයකු හමුවන්න. (නැත්නම් කරදර විය හැකියි කියන අදහස පිළිබිඹු වෙනවා) මේකම අපිට නැහැ කියන අර්ථය (negative) දීමටත් යොදාගන්න පුළුවන්.

I'd better not go out today. I have to do a lot of work.
(I'd better = I had better)
මම අද පිට යන්න හොඳ නෑ. වැඩ ගොඩක් තියෙනවා. (ගියොත් ලොකු පාඩුවක් වෙන්න පුළුවන් කියන අදහස පිළිබිඹු වෙනවා)

you don't look very well today.
You'd better not go to work today.
You'd better = you had better
(යූ ඩෝන්ට් ලුක් වෙරි වෙල් ටු ඩේ. යූඩ් බෙට(ර්) නොට් ගෝ ටු වර්ක් ටුඩේ) අද ඔබේ පෙනුම ඒ තරම් හොඳ නෑ. අද වැඩට යන්න එපා. (වැඩට නොයන එක තමා හොඳ. ගියොත් ගැටලුවක් වෙයි... කියන අදහස පිළිබිඹු වෙනවා.

You'd better be on time.
ඔබ වෙලාවට එන්න. (වෙලාවට එන්න වගබලා ගත්තොත් හොඳයි කියන අදහස) You'd better not be late.
ඔබ පමාවෙලා නොඒමට වගබලා ගත්තොත් හොඳයි කියන අදහස මින් කියැවෙනවා.
'had' කියන වචනය අතීත පදයක් බව ඔබ දන්නවා. ඒත් මතක තියාගන්න මේ ඉහත විස්තර කළ වැකි වලදී 'had' කියන වචනය යෙදුවට ඒකෙන් අර්ථවත් වෙන්නෙ අතීතයට අදාළ දෙයක් නෙමේ. වර්තමානයට අදාළ දෙයක්.

**ආදර දුවේ, පුතේ, “ළමා ප්‍රදීපය” මත විමසුමකට අපි ලක් කළේ බාල වැඩිහිටි සැමගේ අදහස් අපේ ඉදිරි ගමනට වටිනා නිසයි. ඒ “මත විමසුම” අරබා අපට ලැබුණු බොහෝ ලිපි අතර නිරූපා වෙලගෙදර ගුරු මැණියන්ගේ ලිපියත් තෝරා ගෙන අද පළ කරනවා. බලන්න පුංචි ඔබේ අදහස් එක්ක කොතරම් සමීපට මේ අදහස් ගොනු වෙලාද කියලා.**

# ළමා ප්‍රදීපය චිරාත් කාලයක් අප අතර වැජඹේවා !

මම, බප, මීග කඳන සා. සෙ.බා.ප්‍රා. විදුහලේ 5 ශ්‍රේණි භාර ගුරුතුමියක ලෙස කටයුතු කරමි. 1992.08.22 වන දින විවාහ පත්ව ජා-ඇල, කලඑළිය ග්‍රාමයේ පදිංචියට ආ දින සිට ඥානාර්ථ ප්‍රදීපය පුවත් පත කියවීමට අවස්ථාව ලදිමි. එකල ඥානාර්ථ ප්‍රදීපය පුවත්පත තුළම පිටු 2කි න් යුත් ළමා ප්‍රදීපයක් විය ඒ එකතුව තුළින් මම සාන්තුවරයින් ගැන සඳහන් පින්තූර හා විස්තර රැස්කර ඇත්තේ ඉගෙනුම් ආධාරක ලෙස දරුවන්ට පෙන්වීමටයි. මේ දක්වා පළවූ ළමා ප්‍රදීපය ද රැස්කර ජේසුතුමන්ගේ ප්‍රාතිහාර්ය, දේව ප්‍රසාද නිධාන ගැන තොරතුරු දේව මාතාවන් පිළිබඳ තොරතුරු, රැස්කර තබා ඇත්තෙමි. ළමා ප්‍රදීපය ළමයින්ට වෙන්වුවද ඥානාර්ථ ප්‍රදීපය සමඟම මේ පුවත් පතත් කියවීමට මම අතපසු නොකරමි. ආගම විෂය උගන්වන විට මා එහි සඳහන් ලිපි, පින්තූර ඉගෙනුම් ආධාරක ලෙස භාවිත කළෙමි. ආගම පුනරීක්ෂණ පාඩම් මාලාවන් මම ආශාවෙන් කියවමි. මගේ පුතාගේ විභාගය සඳහාද එම පාඩම් මාලාව මහගු අත්වැලක් විය.

මා කුඩා කල සිට මගේ පියා මට මිහිර පත්තරය ගෙන දුන්හැටිත් මා එය ආශාවෙන් කියවූ හැටිත් ඉගෙනුමට එය උදව් කරගත් හැටිත් මට තාම මතකය. මම අද ගුරුවරියක් වී තිබියදීත් මිහිර හා විජය පුවත්පත් සතිපතා මිලදී ගන්නේත් කියවන්නේත් මගෙන් ඉගෙනුම ලබන දරුවන්ට අත්වැලක් වනු පිණිස ය. ඒ කාර්යයේදී ආගම විෂය වඩාත් හොඳින් ඉගැන්වීමට ආගමික පත පොතට අමතරව පාසල් විෂය නිර්දේශය හා ගුරු අත්පොත් වලට අමතරව ළමා ප්‍රදීපය හා ඥානාර්ථ ප්‍රදීපය මහඟු මෙහෙවරක් කළ බව කිව යුතුමය. පුනරීක්ෂණ පාඩම් මාලාව, සුදුවර චරිත, පමණක් නොව ළමා නිර්මාණ ද මම රස වින්දෙමි. 2005 වසරේ මගේ පන්තියේ සිසුවියකගේ නිර්මාණයක් (ළමා ප්‍රදීපයේ පළ වූ) අද ද මා ළඟ සුරක්ෂිත ව ඇත. ළමා ප්‍රදීපය විධිමත් වූ විට පන්තියේ සිසු නිර්මාණ එවා දායක වීමටත් මම සිතා සිටිමි.

**මා සිතනා පරිදි ළමා ප්‍රදීපය අලුත් විය යුත්තේ මෙසේය.**


- පුවත්පතේ කොළ මීට වඩා ප්‍රමිතියකින් යුක්ත වූවා නම් වඩා හොඳය.
- සමහර පිටු එකිනෙකට සබඳතාවයක් නැති පින්තූර, විස්තර, නිර්මාණ වලින් මිරිකී තිබීම යුතු නැත. ඒ වෙනුවට ළමා නිර්මාණ පිටුව විධිමත්විය යුතුය. පාසල් දරුවන්ට වැඩි අවස්ථාවක් නිර්මාණකරණය සඳහා ලබා දිය යුතුය.
- ශුද්ධවන්තයන් , දේව ප්‍රසාද නිධාන , දේව මාතාවන් , ජේසු තුමා කළ ප්‍රාතිහාර්යය, උපමා කථා, ආදිය වර්ණවත් පින්තූර සමඟ සතිපතා පළවන පොතක් ලෙස එකතු කර ගත හැකි වන අයුරින් ඉදිරිපත් කළ හැකිය.
- ළමයින්ට කිවහැකි යාච්ඤා භාවනාමය අත්දැකීම්, පාද නමස්කාර භාවනා සරලව ඉදිරිපත් කර අත්වැලක් සැපයිය හැකිය.
- බයිබලය කියවීමට යොමුකරන බයිබල් පාඨ හෝ උපමා කථා සතිපතා ඉතුරු කොටස් සම්බන්ධ වන ලෙස නිර්මාණය කිරීමෙන් ළමා ප්‍රදීපය මිලදී ගැනීමේ අවස්ථා වැඩි කරගත හැකිය.
- දහම් පාසල් හා කතෝලික පාසල් වල ආගමික ක්‍රියාකාරකම්. සම්බන්ධ අවස්ථා ඡායාරූප හා විස්තර සඳහා ම වෙන ම පිටුවක් තිබීම අගනේ ය.
- ප්‍රහෙලිකාව ද තරගයක් ආකාරයට පුරවා එවීමට යොමු කිරීමෙන් ළමා අවධානය තවත් දිනා ගත හැකිය. (පත්තරය ගත් විගසම මම ද ප්‍රහෙලිකාව පුරවමි. එය මගේ විනෝදාංශය යි.)
- චිත්‍ර කථාවන්හි චිත්‍ර ළමා මනසට ගෝචර ශෛලියකින් වර්ණවත් විය යුතුය.
- බයිබල් දැනුම, දහම් දැනුම, වර්ධනය වන නිර්මාණ ඇතුළත් විය යුතුය.
- කථා එකතු කරගත හැකි ආකාරයට සතිපතා, දෙසති, මාස් පාතා එළිදැක්විය යුතු ය.
- මගේ පෙර පත්තර එකතුවේ ගීතිකා සඳහා ස්වර ප්‍රස්ථාර සිංහලෙන් පළ වූ කුඩා එකතුවක් මා ළඟ ඇත. එය විධිමත් ව දෙසතියකට වතාවක් හෝ පෙරදිග /බටහිර ක්‍රම 2 න්ම පළ කරනවා නම් වඩා හොඳ ය. දරුවන්ට නිවෙසේ සිටම ගීතිකා වාදනයට යොමු විය හැකි ය.
- ලංකාවේ ඒ ඒ සාන්තුවරයන් වෙනුවෙන් කැප කර ඇති දේවස්ථාන, සිද්ධස්ථාන හා ඒවායේ පිහිටීම, මග සලකුනු වන්දනාවේ යන්න්ට අත්වැලක් සපයනු ඇත.

ගරු සහෝදරතුමන්, ගරු පැවිදි සොයුරියන් , ගරු පූජා ප්‍රසාදිතුමන් යන අයගෙන් එක් අයෙකු ගැන එක සතියක ඡායා රූපයක් සමඟ තොරතුරු පළ කෙරේ නම් දරුවන් තුළ අනාගතයේ පැවිදි පූජක එඬේරික ජීවිතයට කැඳවීම් ලැබීමට අත්වැලක් වනු ඇත. පැවිදි පූජක වරම් ලැබුවන්ට ඇගයීමක් වනු ඇත.

- චිත්‍ර කලාව කෙටි කථාව මුද්දර පිටුව ඉංග්‍රීසි පාඩම ද ඒ ඒ වයස් හි දරුවන්ට තවදුරටත් උපකාර වනු ඇත.
- සාන්තුවර මංගල්‍ය දින, ණය මංගල්‍ය දින දරුවන්ට දැනෙන පරිදි ප්‍රබල ව ඉදිරිපත් කළ යුතුය.
- ලංකාවේ පාද නමස්කාරය භක්ති අභ්‍යාසය සඳහා ම විශේෂිත වූ දේවස්ථාන ගැනත් දැනුම්වත්කිරීම බාල මහලු කාටත් වටනේ ය.
- ළමා ප්‍රදීපය කතෝලික පාසල්හි සියලු දරුවන් කියවන, කියවීමට අවශ්‍ය පත්තරයක් බවට පත් කරගත යුතුයි.
- විවිධ අංශයන්හි සුවිශේෂ දස්කම් පාන (පුවත්පතේ නිර්මාණ) දරුවන් ඇගයීමට වැඩ පිලිවෙළක් තිබිය යුතුය.
- පාසල් දරුවන්ට ආගමික විෂය දැනුම දීමටත් අත්වැලක් විය යුතුය.

වර්ණවත් පිටු හා ඡායාරූප පින්තූර සහිත අනාගත ළමා ප්‍රදීපය දරුවාට මිලදී ගැනීමට හැකි මිලක් ද තිබීම හොඳය. ළමා ප්‍රදීපය පුවත්පත අලුත් මුහුණුවරකින් හැඩ වැඩ වී චිරාත් කාලයක් අප තුළ ලැගුම් ගනිත්වායි සුභාසිරි පතමි.

**කලඑලියේ - නිරූපා වෙලගෙදර**







**අපගේ ගැලවුම්කරුවාණෝ**

**අශේන් දිනුක්ෂන්**

05 ශ්‍රේණිය

සාන්ත මරියා දහම් පාසල - මාරවිල






**දියු ඇල්ලක්**

**තිසුරි දෙව්මිණි**

06 ශ්‍රේණිය

දංකොටුව බාලිකා මහා විද්‍යාලය

**දිව බොදුනන් සවමත් වෙමු.**

**ඩිල්කි ෂෙවොනි ප්‍රනාන්දුපුල්ලේ**

07 ශ්‍රේණිය

උත්ථාන වූ කිතු සමිඳුන්ගේ දහම් පාසල

දංකොටුව (ගොඩැල්ල මීසම)





**පරිසරයේ අසිරිය**

**නෙත්මි සුලාංජලී**

05 ශ්‍රේණිය

සාන්ත මරියා දහම්

පාසල - හාල්දඬුවන




# ශු. ක්ලෙමන්ට් මුනිතුමා



රෝමයේ ක්ලෙමන්ට් තුමා අපෝස්තලික පියවරුන් අතර ඉතා වැදගත් තැනක් හිමි කරගත් සභා පියවරුන් අතර ඉතා ප්‍රසිද්ධ අයෙකි. ක්ලෙමන්ට් තුමා ශු. පේදුරු තුමාගෙන් පසු එම පදවියට පත්වූ තුන් වන රදගුරු තුමාය (Hist. Eccl. 3,15,34) ඩොමිෂියන් හා ට්‍රාජන් යන අධිරාජ්‍යවාදීන්ගේ පාලන කාලයේදී මෙතුමා පාප් ධූරය දැරූ බව සඳහන්වේ. රෝමයේ රදගුරු තුමා ලෙස කොරින්ති සභාවේ ඇති වු යම් යම් අරගල නිරාකරණය කිරීමට වෑයම ගත් රදගුරු තුමාය. ක්ලෙමන්ට් තුමා විසින් රෝම සභාවේ සිට ක්‍රි.ව. 96 දී පමණ ලියන ලදි. මෙය ලියැවුණු කාලය නම් ඩොමිෂියන් අධිරාජ්‍යවාදී සමයයි. එබැවින් මෙය ඉතා පැරණි ලියවිල්ලකි. මෙය සරල පැහැදිලි ලිපියකි. මෙම ලිපියේ ප්‍රධාන කොටස් 03 කි.

**1. ආමන්ත්‍රණය හා හැඳින්වීම**

**2. කොරින්තියේ සභාව තුළ පැන නැගුණු භේදයක් විස්තර කරයි. එසේම වැඩිහිටියන්ටත් සභා මූලිකයන්ටත් කීකරු විය යුතු බවත් ඔවුන්ව පත්කර ඇත්තේ අපෝස්තුළුවරුන් බවත් පැහැදිළි කරයි. එම නිසා එම සම්ප්‍රදායයන් දිගින් දිගටම පවත්වාගෙන යායුතු බවත් තහවුරු කරයි.**

**3. භේද දුරලා සාමකාමීව විශ්වාසය රැකගත යුතු ආකාරය පැහැදිලි කරයි.**

ක්ලෙමන්ට් තුමා විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුන ග්‍රීක භාෂාවෙන් ලියන්නට ඇතැයි අනුමාන කරයි. මේ ලිපිය සම්බන්ධ විවිධ මත පල කරන සභා ඉතිහාසඥයන් ප්‍රකාශ කරන්නේ මෙය ප්‍රථම ලිපියේ දෙවන කොටස බවයි. මෙම ලිපිය මඟින් රෝම සභාවට තිබු බලය නැතහොත් නායකත්වය විස්තර කරයි. මෙලෙස රෝම කේන්ද්‍රීයභාවය මෙහිලා දැකිය හැකිය. මෙම ලිපි ලිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ කොරෙන්ති සභාවේ තරුණ නායකයින් විසින් වැඩිහිටි නායකයින් ප්‍රතික්ෂේප කිරීමයි. මෙය හේතුකොටගෙන කොරින්තියේ සභාවේ ක්‍රිස්තියානීන් අතර බෙදීමක් ඇති වූ බැවින් කොරින්තියේ සභාවට අවවාද අනුශාසනා දීම සඳහා මෙම ලිපිය ලියැවී ඇත. මෙම ලිපිය ලිවීමේදී ක්ලෙමන්ට් තුමා පුරාණ මූලාශ්‍ර දෙකක් භාවිත කර ඇත.

**1. පුරාණ ගිවිසුම**


**2. ස්ටොයික් වාද**

පරණ ගිවිසුමේ ජීවන චරිත උදාහරණයට රැගෙන කීකරු කම, නිරහංකාර බව, විශ්වාසය හා යහපත් ගුණධර්ම මෙන්ම ධර්මිෂ්ඨකම දෙවියන්වහන්සේට ප්‍රසන්න බව පෙන්වීම සඳහා ආබ්‍රහම්, නෝවා, ආදීන්ගේ ජීවිත චරිත විග්‍රහ කර ඇත. ස්ටොයික් වාදී මත ක්ලෙමන්ට් තුමා සම්පූර්ණයෙන් විශ්වාස නොකළත් දෙවියන් වහන්සේ විශ්වයේ මැවුම් කරුවාණන් පමණක් නොව සියල්ලේ අධිපතියා ලෙස වැඩ වසන බවත් ක්‍රිස්තුන් වහන්සේ මැවිල්ලට පෙර ජීවමානව වැජඹුන බවත් පෙන්වා දෙන මෙතුමා සියලු නායකයන් පත්වන්නේ ක්‍රිස්තුන් වහන්සේගෙන්ම බව තර්කානුකූලව ඉදිරිපත් කර ඇත. නොස්ටික් වාදය ගැන අනතුරු අඟවමින් ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍යමය භාවය ගැනද උන්වහන්සේ මාංෂිකව නැවත නැගිටීම ගැනද සභාව විශ්වාස කළ යුතු බවද පෙන්වා දෙයි.

නැවත නැඟිටීම හා විනිශ්චය ගැන අවධාරණය කරන මෙම ලිපිය යමෙක් දේව මාලිගාව ශුද්ධවු වස්තුවක් ලෙස ආරක්ෂා කරන්නාක් මෙන් තම ශරීරය නමැති දේව මාලිගාවද ආරක්ෂා කළ යුතු බව පෙන්වා දෙයි. ක්‍රිස්තුස් වහන්සේ තුළින් පමණක් ගැළවීම ලැබෙන බවද මෙම ලිපියෙන් තහවුරු කරන අතර ප්‍රසාද ස්නාපනය හා පව් කමාවේ සක්‍රමේන්තුව පිළිබඳවද මූලික අදහස් මෙම ලිපියේ සටහන් වේ. පාවුළු තුමා හා පේදුරු තුමා මිය ගිය ආකාරය ගැනද කරුණු රැසක් මෙම ලිපියේ සඳහන් වේ. මෙම ලිපිය අධ්‍යයනය කරන විට පෙනී යන කරුණක් නම් ඉහත කී ශ්‍රාවකයන් දෙදෙනා ඉතා කිට්ටුවෙන් දැන හැඳිනගෙන සිටි බවය. ( ක්‍රි.ව. 92-101). රෝමයේ ජීවත්වූ අපෝස්තුළුවරුන්ගේ ගෝලයකු ලෙස හඳුන්වාදෙන ක්ලෙමන්ට් තුමා ප්‍රාණපරිත්‍යාගීවරයකු වූ බව ඉතිහාසය සඳහන් කරයි.

**අසේල දසනායක**

## ප්‍රහේළිකා අංක 40



### හරහට

1.ඔවුන් ක්‍රිස්තුන් වහන්සේව ඇණ ගසන පිණිස හේබ්‍රෙව් බසින් මෙසේ හඳුන්වන කපාල පිටිය නම් ස්ථානයට උන්වහන්සේව ගෙනගිය සේක.

4. ''පටු දොරටුවෙන් ඇතුල් වන්න.....කරන්න'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදළ සේක හිස්තැනට සුදුසු වචන

5. රැකියාවක් කිරීමේ යුතුකම තෙසලෝනික වරුන්ට පහදා දෙමින් ශු. පාවුලු තුමා කිසිවෙකුට බරක් නොවන පිණිස දිවා රෑ දෙකේ මෙසේ වැඩකළ බව ප්‍රකාශ කළේය.

8. ඊශ්‍රායෙල් ජනතාව මුහුද මැදින් ගත් පසු දෙබෑවූ මුහුදු ජලය මැදින් ගමන් ගැනීමට පැමිණි පාරාවොගේ යුද හමුදාවද මෙම රථද ජලය නැවත එක්වීම නිසා විනාශයට පත් විය.

9. ස්වර්ගය යන වචනයට සමාන වචනයකි.

### පහළට

1. ''........... නම් බහුලය ගොවීහු විරලය'' ක්‍රිස්තුන් වහන්සේ වදල සේක. හිස්තැනට සුදුසු වචනය.

2.එක් මිනිසෙක් මිදි වත්තක් වගාකොට එය ..... ට අඳයට දී පිටරට ගියේය. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදළ එක් උපමාවක සඳහන් වේ . මෙහි හිස්තැනට සුදුසු වචනය

3. සිරගතවී සිටි ක්‍රිස්තු භක්තිකයන්ට රහසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව රැගෙන යාම නිසා මරණයට පත්වූ ලාබාල ශුද්ධ වන්තයෙකි.

6. නටඹුන් වී ගිය දේව මාළිගය නැවත ගොඩ නැගීම පිණිස දෙවි යන් වහන්සේගේ පණිවුඩය රැගෙන ආ දිවැසිවරයාගේ නම


7. පේදුරු තුමාගේ පළමු දේශනයේ මෙසේ සඳහන් වේ. ''ඔබ අදමිටු මිනිසුන් ලවා ක්‍රිස්තුන් වහන්සේව කුරුසියේ ඇණ ගස්වා මරා දැමුවහුය''. මෙහි අදමිටු යන වචනයට සමාන නමකි.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. මාක් 12, ශු. ලූක් 13, ශු. ජුවාම් 19, ක්‍රියා 2, තෙසලෝනික 3, හග්ගයි 1 , නික්මයාම 13 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** – කිරිමැටියාගාර

---

# පල්ලන්සේන දහම් පාසලෙන් රටටම ආදර්ශයක් වූ සිසුවියක්...



පල්ලන්සේන මීසමට අයත් දුවන ශුද්ධවූ ත්‍රිත්වය දේවස්ථානයේ දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය දිනයේ දී සවස් භාගයේ පැවති පෙරහැරෙන් පසු 8 වන ශ්‍රේණියේ ඉගනුම ලබන සලෝමි හෙට්ටිආරච්චි නමැති ශිෂ්‍යාව විශාල වටිනාකමින් යුත් අත් රන් වළල්ලක් වීදියේ වැටී තිබී අහුලා මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමාට භාර දී ඇත. එම වළල්ල නැති වූ පුද්ගලයා පියතුමන් වෙත පැමිණ විමසීමෙන් පසු ඔහුට එය ලබා දී ඇත.

පල්ලන්සේන කල්වාරි සෙවන විවෘත වේදිකාව මතට ඇය කැඳවා ඇයගේ ආදර්ශවත් ක්‍රියාව ප්‍රශංසාවට ලක් කරමින් පිරිස ඉදිරියේ ඇයට ත්‍යාගයක් ලබාදීමට පියතුමන්ලා කටයුතු කළහ. සලෝමි සිසුවිය අගය කරන මීසම් සහයක ගරු ගයාන් ප්‍රසන්ත පියතුමා සේයාරුවෙහි දිස්වේ.

**සේයා:- ලෙස්ටර් ජයකොඩි - සටහන :- මෙල්වින් ද කොස්තා**

# සාන්ත මරියා දහම් පාසල - මග්ගොන



මග්ගොන සාන්ත මරියා දහම් පාසලේ දරු දැරියන් 49 දෙනෙකු ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. මග්ගොන, සන්ත විසෙන්ති ආයතනයේ ගරු නොයෙල් මර්වින් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් දේව මෙහෙය පැවත්වුණි.

අනතුරුව ගරු පියතුමන්, සමඟ මීසම් සේවක ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන් ගරු ප්‍රියදර්ශනී පැවිදි සොහොයුරිය දහම් පාසල් ගුරුවරුන් සමඟ දරු දැරියන් ළමා ප්‍රදීපය සඳහා සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**




නුඹ හෙබ්‍රෙව් ජාතිකයෙකුව මැරුවා නේද?
17
ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
ආනන්ද කල්දේරා ...රචනා කරන..
මෝසෙස්
...ඩිෂ්..
ඉදු.. උඹටත් හෙබ්‍රෙව් ජාතිකයෙක් ගෙනිම.
..ආ..හ්..ක්.
ඊජිප්තු.. සෙබළාට මෝසෙස් පහර පිට පහර එල්ල කළේය..
වහල්ලු වුනත් මේත් මිනිස්සු... මනුෂ්‍යයින්ව සළකන්න ඉගෙනගනිං
..හ්ක්.
ඒ පහර වල් වලින් ඔහු මැරී වැටුණේය..
අහ්.. ඔහු මළා.. නේද.. මා.. ඔහුට පහරදී මරා දමනවා කව්රුවත් දැක්කද? ඊට කලින්..
?

ළමා ප්‍රදීපය









# බාලයින් ජේසු වෙතට ගෙනගිය ධර්මදූත ළමා සමාජයට වසර 25 යි

ළමා ධර්මදූත ව්‍යාපාරය ලක්පොළොව මත ආරම්භ කළේ එදා ගරු මැල්කම් රංජිත් පියතුමා වූ අද අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ය...

ලංකාව පුරා සියළු පදවි ආවරණය කරමින් එදා ව්‍යාප්ත වූ ධර්මදූත ළමා සමාජය සජීවක සජීවිකාවන් දහස් ගණනක් හා ළමා ධර්මදූතයින් ලක්ෂ ගණනක් බිහි කළ ව්‍යාපාරයකි.

ජේසුස් වහන්සේ ගැන දැන ගන්නටත්, එය තම ජීවිතය තුළ ප්‍රායෝගිකව අත් දකින්නටත්, එම අත්දැකීම අන් අය හා බෙදාගැනීමටත් ළමා ධර්ම දූත ව්‍යාපාරය අපූරු තැනක් විය.

පසුගිය දා මරදාන සා.ජෝශප් විදුහලේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිය අභිමානවත් වසර 25 ක ධර්මදූතීය ගමන් මග සනිටුහන් කළ අතර, ධර්මදූත ළමා සමාජය වෙනුවෙන් කඳුළු, දහදිය, ශ්‍රමය හා ධනය කැප කළ සියල්ලන්ටම උපහාරයකි මේ !

**සටහන: තිළිණ අලහකෝන් (හිටපු ධර්මදූත ළමා සමාජ සජීවක)**

**ඡායාරූප : අසික ප්‍රියදර්ශන (කොළඹ පදවි සභාපති) / තිළිණ අලහකෝන්**





